www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

| 10/11 ශ්‍රේණි | සිංහල සාහිත්‍ය රසාස්වාදය | ඒකකය 4 - බැද්දේගම |
|---|---|---|

(1) i) අ) බැද්දේගම නවකතාව කාගේ නිර්මාණයක් ද?
ආ) එම නිර්මාණයේ මුල් නම සඳහන් කරන්න.

ii) අ) බැද්දෙගම නවකතාවේ රචකයා කිනම් රටක පුරවැසියෙක් ද?
ආ) ඔහු මෙරට රාජකාරී මෙහෙය වූ දිස්ත්‍රික්ක දෙකක් දක්වන්න.

iii) අ) මෙම නවකතාව සිංහලයට පරිවර්තනය කළ ලේඛකයා කවුරු ද?
ආ) එම නවකතාවට පාදක වූ ගම අයත් දිස්ත්‍රික්කය නම් කරන්න.

iv) පහත සඳහන් ලේඛකයින් විසින් රචිත වනගත ජීවිතය පිළබඳ ලියු ග්‍රන්ථය බැගින් ලියා දක්වන්න.
අ) ආර්. එල්. ස්පිට්ල්
ආ) වූ. චෙං. එන්

v) පහත සඳහන් චරිත ආවේශ .. වූ නෑකම සඳහන් කරන්න.
අ) නැංචොහාමි
ආ) බබුන්

vi) අ) සිලිදු හා බබුන් සිරගත කළ සිරගෙය පැවති ගම සඳහන් කරන්න.
ආ) නැංචෝහාමිගේ ගම් ප්‍රදේශයේ නම දක්වන්න.

vii) අ) බැද්දේගම නවකතාවේ ආරච්චිගෙ රාජකාරිය කුමක් වී ද?
ආ) එම නවකතාවේ දක්වෙන ප්‍රනාන්දු මුදලාලි අදාළ ගමට බලපා ඇත්තේ කෙසේ ද?

viii) අ) පුංචි මැණිකා සතු චරිත ලක්ෂණ දෙකක් දක්වන්න.
ආ)කර්ලිනාහාමි සම්බන්ධ ඔබේ අදහසක් වාක්‍යකින් ලියා දක්වන්න.

ix) අ) බැද්දේගම ගමේ දෙවන ආරච්චි කවුරු ද?
ආ) ඔහු ප්‍රසිද්ධියක් දරා ඇත්තේ කිනම් කාර්යයක් සඳහා ද?

x) අ) මෙරට හමුවන පළමු නවකතාව කුමක් ද?
ආ) එහි රචකයා කවරෙකු ද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

(2) පහත සඳහන් ප්‍රකාශ කා විසින් කා හට කුමන අවස්ථාවේ ප්‍රකාශ කරන ලද්දේදැයි දක්වන්න.

i) ''උඹේ ගම කොහේද ළමයා''

ii) ''මිනිහා අනුමානයක් නෑ මැරෙන්න ඇති.''

iii) ''රාළහාමි ඇත්තටම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද? එයා මළයි කියලා දැනගන්ඩ ලැබුණ ද?

iv) ''ඕ ඒ මිනිහා හරි ඊට පස්සේ ඒ ආරච්චි මැරුවා නේද?''

v) ''කරුණාව වේලිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනයවානේ, ඒත් උඹ ඉල්ලන්නේ වේලිච්ච කුඹුරට තවත් නියඟයක්.''

vi) ''උඹ මේ ගමේ ඉන්න කවුරු හරි කසාද බැඳගනින් ඉළන්දාරියෙන් නැත්නම් නාකියෙක් වුණත් මොකද?

vii) ''ඔව් ඇයි බොල් මැරැඩි කට හඬකින් ඇසී ය.''

(3) අදාළ පරිච්ඡේදය කියවා පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i) ආරච්චි රාළගේ බිරිඳගේ නම සඳහන් කරන්න.

ii) සිලිඳුගේ බිරිඳ හ දරුවන් දෙදෙනා කවුරුන් ද?

iii) කර්ලිනාහාමි යනු සිලිඳුගේ කවුරුන් ද?

iv) පුංචි මැණිකා විවාහ කර ගන්නේ කවුරු ද?

v) එම තැනැත්තා ආරච්චි නිවසට ඇති නෑකම කුමක් ද?

vi) සිලිඳු අතින් ඝාතනයට ලක්වන්නේ කවුරුන් ද?

vii) මෙම ගමේ දෙවන ආරච්චි වන්නේ කවුරුද?

viii) එම ආරච්චි ගුරුකමකින් විවාහ කර ගන්නේ කවුරුන් ද?

ix) කර්ලිනාහාමි ගැන ඔබේ අදහස් වාක්‍ය දෙකක් මඟින් ගෙන හැර දක්වන්න.

x) මෙම නවකතාවේ ඉංග්‍රිසි ලේඛකයා ඒ සඳහා පාදක කර ගන්නේ කිනම් කාරණයක් ද?

**විචාර ප්‍රශ්න**

(4) පාඨක සිතේ අනුකම්පාව ජනිත වන අයුරින්,

1) කර්ලිනාහාමිගේ චරිතය හා

2) පුංචි මැණිකාගේ චරිතය නිරූපණය කිරීමට කතුවරයා සමත් වී ඇති අයුරු පහදන්න.

(එකකට උදාහරණ දෙක බැගින් වචන 125 ක් සෑහේ)

(5) i) සාර්ථක උපමා භාවිතය හා

ii) ඖචිත්‍යයෙන් යුතු සංකේත භාවිතය බැද්දේගම නවකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇති අයුරු විස්තර කරන්න.

(එකකට උදාහරණ දෙක බැගින් වචන 125 ක් සෑහේ)

(6) ක්‍රමක්‍රමයෙන් අභාවයට යන වනගත ගම්මානයක් සජීවී ආකාරයෙන් නිරූපණය කිරීමට කතුවරයා භාෂාව භාවිත කර ඇති අයුරු පහදන්න.

(උදාහරණ තුනක් සමඟින් වචන 100 ක් සෑහේ)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk